# සාමාන්‍ය සමයේ විසි සය වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය — එසෙකියෙල් 18: 25–28

*එසෙකියෙල් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"දුෂ්ඨයා තම දුෂ්ඨකමෙන් හැරී සිටින කල
ඔහු තම ජීවිතය රැක ගන්නේ ය."

"එහෙත්, සමිඳාණන් වහන්සේගේ ක්‍රියා අසාධාරණ ය" යි තුඹලා කියන්නහු ය. අහෝ ඉශ්රායෙල්වරුනි! අසන්න: මාගේ ක්‍රියා සාධාරණ නොවේ ද? සාධාරණ නැත්තේ තුඹලාගේ ක්‍රියා නොවේද? ධර්මිෂ්ඨයෙකු තමාගේ ධර්මිෂ්ඨකමෙන් හැරී, අධර්මිෂ්ඨකම් කරමින් සිට නසින කල ඔහු නසින්නේ, තමා කළ තමාගේ අධර්මිෂ්ඨකම් නිසා ය.

යළිත්, දුෂ්ඨයා තමා කළ දුෂ්ඨකමෙන් හැරී, නීති ගරුක ව ද අවංක ව ද සිටින කල ඔහු තමාගේ ජීවිතය රැක ගන්නේ ය. ඔහු වරද තේරුම් ගෙන තමාගේ සියළු ම වැරදිවලින් හැරෙන නිසා, ඔහු නොනැසී ජීවත් වන්නේ ම ය."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 25: 4–9

පිළිතුර : සමිඳුනි, ඔබ වහන්සේගේ කරුණා ගුණය අපි සිහිපත් කරන්නෙමු.

ගීය : සමිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව:
ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව.
ඔබේ සත්‍යය අනුව මා ගෙනගිය මැනව:
මට එය ඉගැන්නුව මැනව:
මන්ද, ඔබ මාගේ විමුක්තිදායක දෙවිඳාණෝ ය.

දවස පුරා ඔබ එන මග බලා සිටිමි.
සමිඳුනි, ඔබේ කරුණා ගුණයත්, තිර පෙමත් සිහි කළ මැනව.
මේවා ඔබේ චිරාගත ගුණාංගයෝ ය.

සමිඳුනි, මාගේ යොවුන් වියේ පාප ද අපරාධ ද
සිහි නොකළ මැනව.
සමිඳුනි, ඔබේ යහපත්කම ද මහා කරුණාව ද අනුව
මා සිහි කළ මැනව.

සමිඳාණෝ යහපත් යː අවංක ය.
එතුමාණෝ පව්වුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක.
එතුමාණෝ නිහතමානි අය යුක්තියෙහි හසුරුවන සේක.
එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

## දෙවන දේව ප්‍රකාශනය පිලිප්පි 2ː 1 – 5

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති
ජීවිත ආකල්පය ඔබ තුළත් වේවා."

ක්‍රිස්තුස් වහන්සේට අයිති වීමෙන් ඔබට යම් ශක්තියක් තිබේ ද? ප්‍රේමයෙහි යම් අස්වැසිල්ලක් තිබේ ද? ආත්මයාණන් වහන්සේ සමඟ යම් සහභාගිකමක් තිබේ ද? එකිනෙකා කෙරෙහි ආදරයක් හා දයාබරකමක් තිබේ ද? එසේනම්, ඔබ එක සමාන චේතනා ඇති ව, එක ම ප්‍රේමයෙන් බැඳී, එක ම අරමුණකින් එක්සිත් ව සිටීමෙන් මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න. පක්ෂවාදීකමින් වත් පුහු මාන්නයෙන් වත් කිසිවක් නොකරන්න. එකිනෙකා තම තමාට වඩා අන් අය උතුම් යයි යටහත්කමින් සිතන්න. සැමදෙන තම තමාගේ ම යහපත පමණක් නොසොයා, අනුන්ගේ යහපත ගැන ද සලකන්න. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජීවිත ජීවිතාකල්පය ඔබ තුළත් පවතී වා!

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ජොහන් 14: 23

ආලේලූයා! ආලේලූයා!
"යමෙක් මට ප්‍රේම කරන්නේ නම්,
හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය.
මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක.
අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය කරන්නෙමු"යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 21: 28-32

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"අයකැමියෝත්, වෙසඟනෝත් දේව රාජ්‍යයට පැමිණෙති."

තවදුරටත් ජේසුස් වහන්සේ කතා කරමින්, "ඔබ මේ ගැන කුමක් සිතන්නහු ද? එක් මිනිසෙකුට පුත්‍රයෝ දෙදෙනෙක් සිටියහ: ඔහු වැඩිමලා ළඟට ගොස්, 'දරුවා යන්න: අද මිදි වත්තේ වැඩ කරන්නැ' යි කී ය. ඔහු උත්තර දෙමින්, 'නොයමි' යි කී ය. එහෙත්, පසුව පසුතැවිලි වී වැඩට ගියේ ය. පියා දෙවැන්නා ළඟට ගොස් ඔහුටත් මුලින් කී දේ ම කී ය. ඔහු උත්තර දෙමින්, 'ස්වාමිනි, යමි'යි කී ය. එහෙත් නොගියේ ය. ඒ දෙදෙනාගෙන් පියාගේ කැමැත්ත ඉටු කෙළේ කවරෙක්දැ" යි ඇසූ සේක. "වැඩිමලා" යි ඔව්හු කී ය. ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කොට, "සැබැවින් ම මම ඔබට කියමි, අයකැමියෝත්, වෙසඟනෝත් ඔබට පළමුවෙන් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට පැමිණෙති. මන්ද, ජොහන් ධර්මිෂ්ඨ මාර්ගය පෙන්වන පිණිස ඔබ වෙත ආවේ ය. ඔබ ඔහු විශ්වාස කෙළේ නැත. එහෙත්, අයකැමියෝත්, වෙසඟනෝත් ඔහු විශ්වාස කළහ. ඔබ එය දැක ඉන්පසුව වත් ඔහු කෙරෙහි විශ්වාස කරන පිණිස පසුතැවී සිත්හරවා නොගත්තහු ය"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*